**විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2024**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව.

## 1.5 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | ආයතනයේ සියලුම අතිරික්ත මුදල්, අදාළ විෂය භාර අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය මත සිදු කල යුතු වුවද, රු.248,971,554ක් හා USD 1,157,293 ක් ආයෝජනය කිරීමේදී එපරිදි කටයුතු කර නොතිබුණි. | ආයෝජනය සඳහා අනුමැතිය ලබාදෙන ලෙස වන ඉල්ලීමක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට මේ වන විටත් කටයුතු කර ඇති බව. | මුදල් පනතේ විධිවිධාන වලට අනුව අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට අදාල අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 නොවැම්බර් 26 දිනැති අංක 15/2018 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය. | රාජ්‍ය ව්‍යවහාර දෙපාර්තමේන්තුවේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව 2019 අගෝස්තු මස සිට 2024 දෙසැම්බර් දක්වා කාලය තුළ රු. 758,400 ක මුදලක් සේවක අග්‍රහාර රක්ෂණ දායකය වශයෙන් ජාතික රක්ෂණ භාරකාර අරමුදල වෙත ආයතනය විසින් ගෙවා තිබුණි. | ආයතනය මඟින් සිදු කරනු ලබන දායකත්වය "කාර්යය මණ්ඩල සුභසාධනය (Staff Welfare)" යටතේ අදාල වර්ෂයන්හි අයවැය ලේඛණයේ ඇතුලත් කර ඇති අතර එම අයවැය ලේඛණයන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මඟින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා මහා භාණ්ඩාගාරය වෙත යොමුකර අනුමැතිය ලබාගැනීමට කටයුතු කර ඇති බව. | නීති රීති රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 මැයි 18 දිනැති අංක UGC/L/2020 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන | සියලුම පශ්චාත් උපාධි ආයතනවල කළමනාකරණ මණ්ඩලයේ සම්පූර්ණ සාමාජිකත්වය උපරිම සමාජිකයින් 11 දෙනෙකුට සීමාකළ යුතු බව දක්වා තිබියදී ඊට පටහැනිව 2019 ජනවාරි සිට 2024 දෙසැම්බර් | විද්‍යා පශ්චාත් ආයතනයේ දැනට පවත්නා නියමාවලිය සංශෝධනය කිරීම" මැයෙන් වන සන්දේශයක් 2025.04.26 දින පැවැත්වීමට නියමිත 185 වන කළමණාකරණ මණ්ඩල රැස්වීමට යොමුකිරීමට මේ | චක්‍රලේඛ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | කොමිෂන් සභා ලිපිය | 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළදී පවත්වා තිබූ කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් වාර 36 ක් සඳහා උපරිම සාමාජික සංඛ්‍යාව ඉක්මවා සමාජිකයින් 02 සිට 08 දක්වා සමාජිකයින් සහභාගිවී තිබූ අතර ඊට අදාලව රු. 1,535,483 ක අමතර වියදමක් ආයතනය විසින් දරා තිබුණි. | වන විටත් කටයුතු කර ඇති බව. | |
| (ඇ) | 2015 නොවැම්බර් 17 දිනැති අංක 15/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | අභ්‍යන්තර විභාග පවත්වා මාස 03 ක් ඇතුලත ප්‍රතිඵල නිකුත් කළ යුතු බවට දක්වා තිබුණ ද, 2022/2023 අධ්‍යයන වර්ෂයේ පාඨමාලා 05 ක ප්‍රතිඵල නිකුත් කිරීමට මාස 04 සිට මාස 10 ක දක්වා කාලයක් ගත වී තිබුණි. | විභාග අංශය ස්ථාපිත කිරීමේ මූලික පියවර ගනිමින් පවතින අතර විභාග අංශය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වීමත් සමඟ ප්‍රතිඵල ලබා දීම ප්‍රමාදයකින් තොරව කාර්යක්ෂමව සිදු කිරීමට හැකි වනු ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.64,993,387 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවයක් රු. 15,467,962 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.49,525,425 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වර්ෂය තුළ විදේශ විනිමය හුවමාරු අලාභය රු. 36,039,585 ක් වීම, පොලී ආදායම් රු. 41,155,310 කින් අඩුවීම හා රාජ්‍ය ප්‍රදාන නොලැබී යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලයට අදාළව අය විය යුතු රු. 23,497,200 ක හිඟ පාඨමාලා ගාස්තු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට ආයතනය අපොහොසත් වී තිබුණි. | හිඟ පාඨමාලා ගාස්තු සහිත සිසුන්ට විභාග අයදුම්පත්‍ර නිකුත් නොකිරීමටද ආයතනය විසින් ක්‍රියාකරනු ලබන අතර මෙම ක්‍රමවේදය ආරම්භ කිරීමත් සමඟ හිඟ පාඨමාලා ගාස්තු විශාල වශයෙන් අයකර ගැනීමට ආයතනයට හැකියාව ලැබී ඇති බව. | හිඟ පාඨමාලා ගාස්තු අය කිරීමට විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | 2016 දෙසැම්බර් 31 දින සිට පැවත එන අධ්‍යන මණ්ඩල 05 කට අදාල අධි ප්‍රතිපාදිත රු. 260,459 ක් ද, 2018 හා 2019 වර්ෂයන්හි නිම කළ කර්මාන්ත 03 කට අදාලව රු. 1,345,430 ක රඳවුම් මුදල් හා වසර | මෙම වැඩමුළුවට අදාල අවසන් මූල්‍ය ප්‍රකාශන මේ වන විටත් පිළියෙල කර ඇති අතර එය මුදල් කමිටුවට හා කළමනාකරණ මණ්ඩලයට යොමුකර එමගින් ලබාදෙන උපදෙස් ප්‍රකාරව අදාල | දීර්ඝ කාලයක සිට පැවත එන ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 02 ක සිට පැවත එන වැඩමුළු, කෙටි කාලීන පාඨමාලා හා වෙනත් ගෙවිය යුතු වියදම් යටතේ දක්වා තිබුණු රු.169,075ක ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ශේෂයන් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | |
| (ඇ) | එකතුව රු. 10,332,176 ක් වූ පර්යේෂණ ප්‍රදාන 03 ක් නිමකළ යුතු නියමිත කාලසීමාව අවසන් වී මාස 01 සිට 11 ක කාලයක් ගත වී ඇතත් එම පර්යේෂණ අවසන් කිරීමට අපොහොසත් වී තිබුණි. | පර්යේෂණ 2 කට අදාලව කාලය දීර්ඝ කර ඇති අතර එක් පර්යේෂණ කටයුත්තක් අවසන් කර අවසන් වාර්තාව මේ වන විටත් ඉදිරිපත් කර ඇති බව. | පර්යේෂණ ප්‍රදාන කාර්යක්ෂමව උපයෝජනය කර නියමිත දිනයන්හි පර්යේෂණ නිම කිරීමට කටයුතු කළ යුතුය. |